මගේ අංකය : ඩී16/ස්ථානමාරු/2011,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2011.10.19

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ
බන්ධනාගාර සහකාර අධිකාරීන් වෙත.

**<u>වර්ෂ අවසාන ස්ථාන මාරු - 2011</u>**

ස්ථාන මාරු මණ්ඩලයේ තීරණය පරිදි පහත නම් සඳහන් නිලධාරීන්ගේ සහ නිලධාරිණියන්ගේ (11 පෙළ සුභ සාධක නිලධාරී තනතුර හැර) ස්ථාන මාරුවීම් 2012.01.01 දින සිට ක්‍රියාත්මක කරනු ලැබේ.ඒ බව අදාල නිලධාරීන් /නිලධාරිණියන් වෙත දැනුම් දී අවශ්‍ය කටයුතු කරන ලෙස දන්වමි.

02. මෙම සූථාන මාරු සඳහා අභියාචනා ඉදිරිපත් කරන්නේ නම් 2011.10.30 දිනට පෙර මා වෙත ඉදිරිපත් කළ යුතුය.එදිනට පසුව ලැබෙන අභියාචනා සලකා බලනු නොලැබේ.අභියාචනා ඉදිරිපත් කරන විට තමන්ගේ ස්ථිර පදිංචි ලිපිනයද සඳහන් කළ යුතුය.

03. ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමෙන් පසුව එම නිලධාරියා අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ රක්ෂණය වී ඇත්නම් ඔවුන් පිළිබඳව ජාතික රක්ෂණ භාර අරමුදල වෙත දැනුම් දීම කළයුතුය.

04. සිර මැදිරි වල කාර්ය භාර නිලධාරීන් ලෙස සේවය කරන නිලධාරීන් ස්ථාන මාරු කර ඇත්නම් අනුප්‍රාප්තිකයින් පැමිණීමෙන් පසුව පමණක් ඔවුන් ස්ථාන මාරු කිරීමට වග බලා ගත යුතුය.

05. දැනට සේවය කරනු ලබන සේවා  ස්ථානයේ වසර 03කට වඩා සේවය කර ඇති නිලධාරීන් සඳහා පමණක් ගමන් වියදම් රජය විසින් ගෙවනු ලැබේ.

06. ලිපිකාර කටයුතු වල යෙදී සිටින නිලධාරීන් ස්ථාන මාරු වන්නේ නම් ඔවුන් වෙනුවට වෙනත් නිලධාරීන් පුහුණු කිරීමට කටයුතු කළ යුතුය.ඔබ ආයතනයේ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කර නැත්නම් ඒ බවට මා වෙත වාර්තා කළ යුතුය.

07. ස්ථාන මාරු වීම් වලින් පසුව එකම පවුලේ අය එකම සේවා ස්ථානයක සෙවයේ යෙදී සිටී නම් ,ඒ ගැන වාර්තා කරන්න.

08. මෙම ලේඛණයේ නම් සඳහන් කර නොමැති නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කර ඇත.

ස්ථාන මාරු මණ්ඩලය :-

| | | |
|---|---|---|
| 1. මූලස්ථාන අධිකාරී | - | කේ.එම්.ජී.බී.කුලතුංග මහතා. |
| 2. සහකාර බන්ධනාගාර අධිකාරී (සු.සා.) | - | එස්.එල්.එස්.චන්ද්‍රසිරි මහතා. |
| 3. පරිපාලන නිලධාරිණී | - | ජ්.එම්.පී.අත්තනායක මිය. |

පී.ඩබ්ලිව්.කොඩිප්පිලි
බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල්

පී.ඩබ්ලිව්. කොඩිප්පිලි
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.